**AIA Insurance Lanka PLC** (Co. No. PQ 18)

Head Office
P O Box 2088
75, Kumaran Ratnam Road,
Colombo 2, Sri Lanka
T : (+94 11) 231 0310
F : (+94 11) 244 7620
E : lk.info@aia.com

AIALIFE.COM.LK

# Media Release

## AIA වෙල්ත් ප්ලෑනර්වරුන් 24 දෙනෙක් ලොව විශිෂ්ටයින් අතර

විශිෂ්ටත්වය කරා යාම සඳහා AIA ඉන්ෂුවරන්ස් තුළ ඇති ප්‍රබල විශ්වාසය තවදුරටත් සනාථ කරමින් AIA වෙල්ත් ප්ලෑනර් වෘත්තිකයින් 24 දෙනෙක් මෙම වසරේ ද MDRT සම්මන්ත්‍රණය සඳහා සහභාගී වීමේ සුදුසුකම් ලබා ගත්හ. මෙවර MDRT (ඩොලර් මිලියනයේ වටමේසය) සම්මන්ත්‍රණය ජූනි මස 14 සිට 17 වැනි දා දක්වා ඇමරිකා එක්සත් ජනපදයේ ලුයිසියානා ප්‍රාන්තයේ නිව් ඕලීන්ස්හි පැවැත්වෙන අතර එය ජීවිත රක්ෂණ අලෙවි ක්ෂේත්‍රයෙහි ලොව විශිෂ්ටතම කඩඉම් දර්ශකය වේ.

සෑම වසරකම ලොව විශිෂ්ටතම ජීවිත රක්ෂණ අලෙවි වෘත්තිකයින් ආකර්ශනය කර ගන්නා වූ මෙම සම්මන්ත්‍රණය වෙත ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සාමාජිකයින් විශාල පිරිසකින් යුතු කණ්ඩායමක් සහභාගී කරවීමට AIA ඉන්ෂුවරන්ස් අඛණ්ඩව සමත් විය. මෙම වසර සඳහා වසරේ විශිෂ්ටතම වෙල්ත් ප්ලෑනර් වශයෙන් තේරී පත් වූ කොළඹ ප්‍රාදේශීය කාර්යාලය 1 නියෝජනය කළ හුෂානි විමලසේන සහ අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලය නියෝජනය කළ ඩී ජී ඒ ස්වර්ණා සම්භාවනීය කෝට් ඔෆ් ද ටේබල් තත්ත්වය අත්පත් කරගැනීමට සමත් වූහ.

මූල්‍යමය වෘත්තිකයින්ගේ ප්‍රමුඛ සංගමයක් වන MDRT යනු ලොව රටවල් 71 ක සමාගම් 470 කට අධික සංඛ්‍යාවක සේවයේ නියුතු, විශිෂ්ට ජාත්‍යන්තර ජීවිත රක්ෂණ සහ මූල්‍ය සේවා වෘත්තිකයින් 42,000 කට අධික සංඛ්‍යාවකින් සැදුම්ලත්, 1927 වර්ශයෙහි දී ස්ථාපනය කරන ලද ස්වාධීන සංගමයකි. MDRT සාමාජිකයින් අති විශිෂ්ට වෘත්තීයමය දැනුම, මනා සදාචාරාත්මක හැසිරීම සහ අසමසම සේවාලාභී සත්කාරය විදහා දක්වති. මෙම වසරේදී MDRT යාවජීව සාමාජිකයින් සිව් දෙනෙකු AIA සතු වන අතර ඔවුන් නම්, MDRT යාවජීව සාමාජිකත්වයෙන් පිදුම් ලද පළමු ශ්‍රී ලාංකිකයා වූ අජිත් ප්‍රනාන්දු, MDRT යාවජීව සාමාජිකත්වය අත්පත් කරගත් ප්‍රථම ශ්‍රී ලාංකික කාන්තාව වූ ඩී ජී ඒ ස්වර්ණා, ප්‍රියන්ත හපුආරච්චි සහ ඒ මනිවන්නන් වේ.

සෙසු MDRT සාමාජිකයින් නම් ඃ රොෂාන් වීරකෝන්, තුරාජ් අපෝන්සු, ධනන්ජය පෙරේරා, ක්‍රිෂාන් දසනායක, ඩබ් වී ඒ ආර් එස් වේරගොඩ, එම් එස් ජයලාල්, මනෝජ් මිරැන්ඩා, නිමල් බලවර්ධන, ගාමිණි හේවාරත්න, රොෂාන් සමන්ත, කේ එස් අමරජීව,

නිමේෂ් අබේවික්‍රම, නිලන්ත බණ්ඩාර, එස් ඩී එස් පද්මිණි ගුණරත්න, ඩබ්ලිව් එල් සී ඩී ඩී ඒ ගුණතිලක, ජී එම් කේ බණ්ඩාර, කේ නිලංකා අබේසිංහ, සුමිත් රන්වත්ත සහ ප්‍රියන්ති ඩයස් වේ.

MDRT සම්මන්ත්‍රණය සඳහා සුදුසුකම් ලද වෙල්ත් ප්ලෑනර්වරුන්ට අමතරව තවත් AIA වෙල්ත් ප්ලෑනර් වෘත්තිකයින් නව දෙනෙකු ජාත්‍යන්තර තත්ත්ව සම්මානයෙන් (IQA) පිදුම් ලදහ. ඔවුන් නම් ඩී ජී ඒ ස්වර්ණා, හුෂානි විමලසේන, ඒ එච් ඔ ඩී ජයවීර, අජිත් ප්‍රනාන්දු, පද්මිණි ගුණරත්න, පී එච් ආර් සඳකැළුම්, තුරාජ් අපොන්සු, ටී සී මද්දුමලියනගේ සහ එල් අයි පිටිගම්පළ යන වෘත්තිකයින් වෙති. මෙම සම්මානය ජීවිත රක්ෂණ ක්ෂේත්‍රයෙහි අති විශිෂ්ට වර්ධනයක් අත්පත් කරගනිමින් ඉහළ කාර්යසාධනයක් සහ සේවාලාභීන් වෙත මනා උපදේශන සේවාවක් අඛණ්ඩව පවත්වා ගෙන යන ලද රක්ෂණ නියෝජිතයින් ඇගයුමට ලක් කිරීම උදෙසා ප්‍රදානය කෙරේ.

AIA ඉන්ෂුවරන්ස්හි නියෝජ්‍ය ප්‍රධාන විධායක නිලධාරී උපුල් විජේසිංහ මේ පිළිබඳව මෙසේ සිය අදහස් පළ කලේය. ''MDRT සම්මන්ත්‍රණය සඳහා සහභාගී වීමට සුදුසුකම් ලබාගත් අපගේ වෙල්ත් ප්ලෑනර්වරුන් ලද මෙම සුවිශේෂී ජයග්‍රහනයන් තුළින් ඔවුන්ගේ විශිෂ්ටත්වය, කැපවීම සහ වෘත්තීයමයභාවය මැනවින් විදහා දක්වෙනවා. MDRT ජයග්‍රහනයන් ඔස්සේ අප වෙල්ත් ප්ලෑනර්වරුන්ගේ උසස් තත්ත්වයේ ආචාරධර්ම, වෘත්තීය දැනුම, අසමසම සේවය සහ ඵලදායීතාවය පිළිඹිබු කෙරෙනවා. අපගේ කැප වූ අලෙවි වෘත්තික පිරිස AIA හි අපට ඉමහත් අභිමානයක්.''

**ඡායාරූපය ඃ**

AIA හි MDRT ජයග්‍රාහක ජයග්‍රාහිකාවන් ඃ අජිත් ප්‍රනාන්දු (2010 **දී MDRT යාවජීව සාමාජිකත්වයෙන් පිදුම් ලද පළමු ශ්‍රී ලාංකිකයා**), ඩී ජී ඒ ස්වර්ණා, (2011 **දී MDRT යාවජීව සාමාජිකත්වය අත්පත් කරගත් ප්‍රථම ශ්‍රී ලාංකික කාන්තාව සහ** 2015 **වසර සඳහා කෝට් ඔෆ් ද ටේබල් තත්ත්වය**) ප්‍රියන්ත හපුආරච්චි (**MDRT යාවජීව සාමාජිකත්වය** - 2012), ඒ මනිවනන් (**MDRT යාවජීව සාමාජිකත්වය** - 2015) සහ හුෂානි විමලසේන (**කෝට් ඔෆ් ද ටේබල්** - 2015)

**සමාප්තයි**

**Media Enquiries: Suren Perera, Head of Marketing & Company Spokesman Office – 2310028, Mobile – 0773 457 959**